පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

# තෙවන වාර පරීක්ෂණය - 2023

10 ශ්‍රේණිය **ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - I, II**

විභාග අංකය : ..........................................

කාලය: පැය 03 යි
අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

උපදෙස් :

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
- ඔබට සැපෙයන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

- පහත සිද්ධිය ඇසුරුන් අංක 1 - 5 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

පාසල් ප්‍රවාහන සේවා සපයන සී/ස අනුරාධපුර සමූපකාර සමිතිය
එම කාර්ය සඳහා බස් රථ දෙකක් යොදාගනී.

01. සී/ස අනුරාධපුර විවිධ සේවා සමූපකාර සිමිතිය සපයන අවශ්‍යතාව වන්නේ,
   1. අධ්‍යාපන  2. ප්‍රවාහන  3. සන්නිවේදන  4. ආහාර

02. මෙම ව්‍යාපාරය හිමිකාරීත්වය අනුව
   1. රජය හිමිකාරීත්ව  2. පෞද්ගලික හිමිකාරීත්වය
   3. රජය හා පෞද්ගලික හිමිකාරීත්වය  4. රජය හා විදේශ හිමිකාරීත්වය

03. මෙම ව්‍යාපාරය ලියාපදිංචිය සඳහා බලපාන නීතිය
   1. 2007 අංක 7  2. 1890  3. 1972 අංක 5  4. 1918 අංක 06

04. මෙම ව්‍යාපාර නිෂ්පාදිත වල ස්වභාවය අනුව
   1. ප්‍රවාහන ව්‍යාපාරයකි  2. අධ්‍යාපන ව්‍යාපාරයකි
   3. භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයකි  4. සේවා සපයන ව්‍යාපාරයකි

05. පාසල් ප්‍රවාහනය සඳහා යොදා ගන්නා බස්රථ අයත් නිෂ්පාදන සාධකය වනුයේ,
   1. භූමිය  2. ශ්‍රමය  3. ප්‍රාග්ධනය  4. ව්‍යවසාය

06. ඒක පුද්ගල ව්‍යාපාර, හවුල් ව්‍යාපාර වලට වඩා සංස්ථාපිත සමාගම් ජනප්‍රිය වීමට හේතුව වන්නේ,
   1. ස්වාධීන තීරණ ගැනීම  2. ලාභය බෙදීයාම
   3. අඛණ්ඩ පැවැත්ම  4. අසීමිත වගකීම

07. ආහාර .............................. වන අතර පාන් ................................ කී.

1. වුවමනා, අවශ්‍යතා
2. භාණ්ඩ, සේවා
3. අවශ්‍යතා, භාණ්ඩ
4. අවශ්‍යතා, වුවමනා

08. ඇල්මැති පාර්ශවයන් හා ඔවුන්ගේ අරමුණ පහත දැක්වේ.

| ඇල්මැති පාර්ශවය | අරමුණු |
|---|---|
| 1. අයිතිකරු | A. සාධාරන වැටුපක් ලැබීම |
| 2. සේවකයින් | B. ණය අයකර ගැනීම |
| 3. මූල්‍ය ආයතන | C. නිවැරදි කළමනාකරණ තීරණ |
| 4. කලමනාකරුවන් | D. ව්‍යාපාරයේ වර්ධනය |

ඇල්මැති පාර්ශව වල අරමුණු පිළිවෙලින් දක්වන්න.

1. D A B C
2. D C B A
3. D C A D
4. D A C D

09. හවුල් ව්‍යාපාරයක ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම තුලින්,

1. අයිතිය තහවුරු වේ.
2. නෛතික පුද්ගලභාවයක් ලැබේ
3. අඛණ්ඩ පැවැත්මක් ඇතිවේ
4. වගකීම සීමිත වේ.

10. ආර්ථික පරිසර සාධක වන්නේ,

1. උද්ධමනය, සමාගම් පනත, ජන සංක්‍රමන
2. උද්ධමන, ඉතුරුම්, නවීන යන්ත්‍ර
3. උද්ධමනය, විනිමය අනුපාත, හවුල් ව්‍යාපාර
4. උද්ධමනය, විනියම අනුපාත, ණය පොලී

11. රබර් ආශ්‍රිත නිෂ්පාදන සිදු කරන සංස්ථාපිත සමාගමක් සේවකයින් 30දෙනෙකු තම කටයුතු සඳහා යොදාගනී. මෙය,

1. කේවල ස්වාමි ව්‍යාපාරයකි.
2. මහා පරිමාන ව්‍යාපාරයකි.
3. සේවා සපයන ව්‍යාපාරයකි.
4. සුළු පරිමාන ව්‍යාපාරයකි.

12. ව්‍යාපාර සංවිධාන සම්බන්ධයෙන් පහත ප්‍රකාශ අතරින් සත්‍ය ප්‍රකාශනය කුමක්ද?

1. ඒක පුද්ගල ව්‍යාපාර ලියාපදිංචිය අනිවාර්ය නොවේ.
2. ඒකක පුද්ගල ව්‍යාපාර වලට නෛතික පුද්ගලභාවයක් තිබේ.
3. සංස්ථාපිත සමාගම් ලියාපදිංචිය ව්‍යාපාර නාම ආඥාපනත යටතේ සිදු කෙරේ.
4. ඒක පුද්ගල ව්‍යාපාර අයිතිකරු බුන්වත් වුවද ව්‍යාපාරය අවසන් නොවේ.

13.

| ව්‍යාපාරය | ව්‍යාපාර සංවිධානය |
|---|---|
| 1. සී/ස දමිත් (පොදු) සමාගම | A. සංස්ථාව |
| 2. සමන්ත සහ පුත්‍රයෝ ව්‍යාපාරය | B. දෙපාර්තුමේන්තු |
| 3. ශ්‍රී ලංකා වරාය අධිකාරිය | C. හවුල් ව්‍යාපාර |
| 4. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව | D. සංස්ථාපිත සමාගම් |

ව්‍යාපාර සඳහා ගැලපෙන ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ,

1. D A C B
2. D C B A
3. A B C D
4. D C A B

14. ව්‍යාපාර සංවිධානයක ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A – අඛණ්ඩ පැවැත්ම

B – පූර්ණ අයිතිය රජය සතුය

C – අරමුදල් රජය මගින් සැපයේ

මෙම ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ,

1. සංස්ථා 2. දෙපාර්තමේන්තු 3. සමුපකාරය 4. හවුල් ව්‍යාපාර

15. A – භාණ්ඩ හා සේවා රටවලි අතර හුවමාරුව

B – ශ්‍රමය රටවල් අතර හුවමාරුව

C – ප්‍රාග්ධනය බදාවකින් තොරව හුවමාරුව

ඉහත සඳහන් ලක්ෂණ අයත්වන ව්‍යාපාර පරිසර සාධකය වන්නේ,

1. ආර්ථික පරිසරය 2. ගෝලීය පරිසරය 3. තාක්ෂණික පරිසරය 4. දේශපාලන පරිසරය

16.

| | රට | මුදල් ඒකකය |
|---|---|---|
| 1. | ජපානය | A. යුවාන් |
| 2. | චීනය | B. යෙන් |
| 3. | ඉන්දියාව | C. ස්ටලිං පවුම් |
| 4. | බ්‍රිතාන්‍ය | D. රුපියල |

මුදල් ඒකක පිළිවෙලින්,

1. B A D C 2. B C D A 3. B A C D 4. A B C D

17. අඩුවීම - හර වැඩි වීම - බැර ද්විත්ව සටහන් මූලධර්මය අදාල වන්නේ,

1. ප්‍රාග්ධන ගිණුම 2. දුන් වට්ටම් ගිණුම 3. ණයගැති ගිණුම 4. ගැණුම් ගිණුම

18. රු. 30 000 පිරිවැය වූ භාණ්ඩ 45 000 ණයට විකිණීම. මෙම ගනුදෙනුව නිසා,

1. හිමිකම 15 000 වැඩි වේ. 2. හිමිකම 15 000 අඩු වේ.

3. වත්කම් 45 00 අඩු වේ. 4. වගකීම් 30 000 අඩු වේ.

19. ව්‍යාපාරයක ගිණුම්කරණ සමීකරණයේ වගකීම් වෙනස්වීමට බලපාන ගනුදෙනුව වන්නේ,

1. මුදලට ගැණුම් රු. 35 000 2. බැංකු ණය පොලී ගෙවීම 6 000

3. විදුලි වියදම් ගෙවීම 4 000 4. ණයට ගැණුම් 12 000

20. ව්‍යාපාරයක වත්කම් වලට පමණක් බලපාන ගනුදෙනුව වන්නේ,

1. රු. 300 000 ප්‍රාග්ධනය ලෙස යෙදවීම. 2. රු. 500 000 බැංකු ණයක් ගැනීම.

3. රු. 300 000 යන්ත්‍රයක් ණයට ගැනීම. 4. රු. 300 000 යන්ත්‍රයක් මුදලට ගැනීම.

21. ව්‍යාපාරයේ කාර්යාලය සඳහා රු. 300 000 Photocopy යන්ත්‍රයක් සී/ස හසල (පොදු) සමාගමෙන් ණයට ගැනීම. මෙම ගනුදෙනුව සටහන් කිරීමේ ද්විත්ව සටහන

1. ගැනුම් ගිණුම - හර 300 000
   මුදල් ගිනුම - බැර 300 000
2. යන්ත්‍ර ගිණුම - හර 300 000
   සී/ස හසල (පොදු) සමාගම- බැර 300 000
3. යන්ත්‍ර ගිණුම - හර 300 000
   මුදල් ගිණුම - හර 300 000
4. ගැනුම් ගිණුම - හර 300 000
   සී/ස හසල (පොදු) සමාගම - හර 300 000

22. ජංගම වත්කම් වන්නේ,

1. මුදල්, බැංකු අයිරාව, තොගය
2. මුදල්, ලැබිය යුතු ආදායම්, තොගය
3. මුදල්', බැංකු ශේෂය, තොගය
4. මුදල්, ගෙවිය යුතු වියදම්, තොගය

23. අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් හෝ සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ඇති වන ව්‍යාපාරය විසින් ගෙවිය යුතු අගය

1. හිමිකම 2. ආදායම් 3. වගකීම් 4. වියදම්

24. ව්‍යාපාරයක 2023.01.01 දිනට වත්කම් හා වගකීම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| ඉඩම් | 200 000 | බැංකු ණය | 100 000 |
| මෝටර් රථ | 50 000 | ණයහිමියෝ | 15 000 |
| ණයගැති | 25 000 | බැංකු අයිරාව | 5 000 |
| තොගය | 10 000 | | |

2023.01.01 දිනට හිමිකම වන්නේ,

1. 285 000 2. 120 000 3. 145 000 4. 165 000

25. මුදල් + තොගය + යන්ත්‍ර = බැංකු ණය + ණය හිමි + ප්‍රාග්ධනය

70 000 150 000 50 000 5 000 300 000

ඉහත ගිණුම්කරණ සමීකරණයේ මුදල් වල අගය වන්නේ,

1. 135 000 2. 355 000 3. 220 000 4. 150 000

26. සචින්තගේ ව්‍යාපාරයේ 2023.06.31 දිනට සුළු මුදල් පොතේ ශේෂය රු. 800 ක් විය. 2023.07.01 අග්‍රිමය ප්‍රතිපූර්ණය 9 200 ක් විය. ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමය වන්නේ,

1. 10 000 2. 9 200 3. 800 4. 8 400

27. සමන්තගේ ව්‍යාපාරයේ 2023.01.01 දිනට අග්‍රිමය 4 000 සුළු මුදල් වියදම් පහත දැක්වේ. සංග්‍රහ වියදම් 400, ලිපිද්‍රව්‍ය 200, ණයහිමි ගෙවීම් 1 000, විවිධ වියදම් 100, ප්‍රතිපූර්ණය කල යුතු වටිනාකම වනුයේ,

1. 1 600 2. 2 300 3. 4 000 4. 1 700

28. ද්විත්ව කාර්යයන් ඉටුකරනු මූලික සටහන් පොත් වන්නේ,

A – ගැනුම් ජර්නලය　　B – මුදල් පොත

C – බැංකු ගිණුම　　D – සුළු මුදල් පොත

1. B C D　2. A B C　3. A C D　4. A B C

29. රු. 10 000 ණයගැතියෙකුගෙන් නියමිත කාලය තුල මුදල් ලැබීමේදී දුන් වට්ටම 10%, වට්ටම් ගිණුම්ගත කිරිම සඳහා අදාල ද්විත්ව සටහන් වන්නේ,

1. දුන් වට්ටම් ගිණුම හර - 1 000
ණයගැති ගිණුම බැර - 1 000
2. දුන් වට්ටම් ගිණුම හර - 9 000
ණයගැති ගිණුම බැර - 9 000
3. දුන් වට්ටම් ගිණුම හර - 1 000
ණයහිමි ගිණුම බැර - 1 000
4. ණයගැති ගිණුම හර - 1 000
දුන් වට්ටම් ගිණුම බැර - 1 000

30. 2023.12.31 දිනට දම්සරගේ ව්‍යාපාරයේ ශේෂ පිරික්සුමේ එකතුව සමාන නොවීය. හර තීරුවේ එකතුව 356 000 බැර තීරුවේ එකතුව 463 000 යි. අවිනිශ්චිත ගිණුමේ ශේෂය වන්නේ,

1. 100 700 (බැර)　2. 107 000 (හර)　3. 100 070 (හර)　4. 107 000 (බැර)

31. ගිණුම්වර්ෂය අවසානයේ දී ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම අසමාන වීමනිසා අවිනිශ්චිත ගිණුමක් ඇතිවිය. පසුව ගිණුම පරීක්‍ෂා කිරීමේදී පහත වැරදි අනාවරණය විය.

A – රු. 20 000 ගැනුම්, ගැනුම් ගිණුමේ සටහන් කර නොමැත.

B – රු. 10 000 විකුණුම් ඉන්වොයිසියක් සටහන් කර නොමැත.

C – රු. 5 000 වැටුප් ගිණුමේ ශේෂය ශේෂ පිරික්සුමට සටහන් කර නොමැත.

ශේෂ පිරික්සුමේ වෙනසක් ඇතිකරන වැරදි වන්නේ,

1. A B　2. A C　3. B C　4. A B C

32. ඉහත වැරදි නිවැරදි කිරීමට පෙර ශේෂ පිරික්සුමේ පැවති වෙනස වන්නේ,

1. 15 000 (හර)　2. 25 000 (බැර)　3. 15 000 (බැර)　4. 25 000 (හර)

33. ශාන්තගේ ව්‍යාපාරයේ 2023.01.31 දිනට බැංකු ගිණුමේ ශේෂය 27 000 (හර) වන අතර එය බැංකු ප්‍රකාශනයේ ශේෂයට සමාන නොවීය. පසුව පහත කරුණු අනාවරණය කර ගන්නා ලදී.

A – නිකුත් කල නමුත් ගෙවීමට ඉදිරිපත් නොකල චෙක්පත් රු. 15 000

B – ණයගැතියෙකු සෘජුවම බැංකුවේ තැන්පත් කල මුදල 5 000

C – බැංකුව විසින් අයකල බැංකු ගාස්තු 1 000

D – තැන්පත් කල නමුත් නිශ්කාශනය නොවූ චෙක්පත් 10 000

බැංකු ප්‍රකාශනයේ 2023.01.31 දිනට පැවති ශේෂය වන්නේ,

1. 31 000 (බැර)　2. 31 000 (හර)　3. 36 000 (හර)　4. 36 000 (බැර)

34. 2023.01.31 දිනට සංශෝධිත බැංකු ගිණුමේ ශේෂය

1. 32 000 (හර)　2. 31 000 (හර)　3. 26 000 (හර)　4. 23 000 (හර)

- විසිතුරු මසුන් අලෙවිකරන ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනු පහත දැක්වේ. ඒ ඇසුරින් ප්‍රශ්න අංක 35-37 දක්වා පිළිතුරු සපයන්න.

A – විසිතුරු මසුන් ණයට ගැනීම 30 000

B – ටැංකි ණයට ගැනීම 150 000

C – රු. 12 000 විසිතුරු මසුන් අලෙවි කිරීම.

D – රු. 25 000 විසිතුරු මසුන් ණයට විකිණීම.

35. පොදු ජර්නලයේ සටහන් කරන ගනුදෙනුව වන්නේ,
    1. A  2. B  3. C  4. D

36. ගැනුම් ජර්නලයේ සටහන් කරන ගනුදෙනුව වන්නේ,
    1. A  2. B  3. C  4. D

37. විකුණුම් ජර්නලයේ සටහන් කරන ගනුදෙනුව වන්නේ,
    1. A  2. B  3. C  4. D

38. වර්තමානයේ බොහෝ ව්‍යාපාර තම ගනුදෙනු පරිගණක මගින් ස්වයංක්‍රියව පිලියෙල කරයි. එසේ භාවිතා කරන ගිණුම්කරණ මෘදුකාංගයක් නොවන්නේ,
    1. Accpac  2. MYOB  3. Sage  4. Windoes

39. රු. 18 000 ලකුණු කල මිල සහිත භාණ්ඩ තොගයක් 10% වෙළඳ වට්ටමක් අඩු කර විකුණන ලදී. මෙම ගනුදෙනුව සටහන් කරන,

| | මූලික සටහන් පොත | මූලාශ්‍ර ලේඛනය | වටිනාකම |
|---|---|---|---|
| 1. | මුදල් පොත | ලදුපත | 16 200 |
| 2. | විකුණුම් ජර්නලය | ඉන්වොයිසිය | 18 000 |
| 3. | මුදල් පොත | ලදුපත | 18 000 |
| 4. | විකුණුම් ජර්නලය | ඉන්වොයිසිය | 16 200 |

40. A – ගැණුම් ජර්නලය  B – විකුණුම් ජර්නලය

C – මුදල් පොත  D – පොදු ජර්නලය

ඉහත මූලික සටහන් පොත් වලට අදාල මූලාශ්‍ර ලේඛන පිළිවෙළින්,

1. ඉන්වොයිසිය, ඉන්වොයිසිය, ලදුපත, ජර්නල් වවුචරය
2. ඉන්වොයිසිය, ලදුපත, ඉන්වොයිසිය, ජර්නල් වවුචරය
3. ඉන්වොයිසිය, ජර්නල් වවුචරය, ලදුපත, ඉන්වොයිසිය
4. ඉන්වොයිසිය, ඉන්වොයිසිය, ජර්නල් වවුචරය, ලදුපත

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

**තෙවන වාර පරීක්ෂණය - 2023**

10 ශ්‍රේණිය **ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - II**

විභාග අංකය : ..........................................

උපදෙස් :

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව I කොටසෙන් ප්‍රශ්න දෙකක් ද, II කොටසෙන් ප්‍රශ්න දෙකක් ද බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. ඊට වැඩියෙන් ලියා ඇති පිළිතුරු, අයදුම්කරු විසින් කපා හැර නොමැති අවස්ථාවල දී ලකුණු නොකර ම කපා හරිනු ලැබේ.

---

01. ග්‍රාමීය ප්‍රදේශයක ජීවත්වන නන්දන ඔහු සතු ලක්ෂ 1 000 000 වටිනා වගාවට සුදුසු ඉඩම ද අලෙවිකරණය පිළිබඳ උපාධියක් හදාරා ඇති චානුක ද සමග 2023.03.01 දේශීය සහල් වර්ග නිපදවීමේ ව්‍යාපාරයක් "වියලිකලාපීය දේශීය සහල් " නමින් ආරම්භ කරන ලදී. චානුක රු. 500 000 ක් ප්‍රාග්ධනය ලෙස යොදවන ලදී. වගා කටයුතු නන්දන විසින් සිදු කළ යුතු බව දෙදෙනාගේ එකඟතාවය විය. දේශිය සහල් සඳහා පාරිභෝගික ඉල්ලුම ඉහලයාමත් මෑත කාලයේදී සිදුවිය. මාර්තු මාසයේදී පහත ගනුදෙනු සිදු විය.

03/01 ඉඩම සකස් කිරීම 125 000 බිත්තර වී සඳහා රු. 50 000, කොම්පොස්ට් පොහොර සඳහා 50 000 යි. ශ්‍රමිකයින් සඳහා ගෙවීම 18 000 යි. කාබනික කෘෂි රසායන සඳහා රු. 25 000 යි.

i. අ. වියලිකලාපීය දේශීය සහල් ව්‍යාපාරය සපයන අවශ්‍යතාවය කුමක්ද?
   ආ. මෙම ව්‍යාපාරය සපයන වුවමනාව කුමක්ද?

ii. අ. මෙම ව්‍යාපාරය සතු ශක්තීන් දෙකක් ලියන්න.
   ආ. මෙම ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශව දෙකක් හා ඊට උදාහරණ ලියන්න.

iii. අ. නිෂ්පාදිත වල ස්වභාවය අනුව මෙය කුමන ව්‍යාපාරයක්ද?
   ආ. අයිතිය අනුව මෙය කුමන ව්‍යාපාර සංවිධානයක්ද?

iv. මෙම ව්‍යාපාරයේ නාමය ලියාපදිංචි කළ යුතුද? ඊට හේතුව කුමක්ද?

v. 2023.03.01 දිනට මෙම ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණය වටිනාකම සහිතව දක්වන්න.

vi. මෙම ව්‍යාපාරය භාවිත කළ යුතු මූලික සටහන් පොත් දෙකක් සඳහන් කරන්න.

vii. 2023 මාර්තු මාසය සඳහා මුදල් පොත පිළියෙල කර මුදල් ශේෂය ගණනය කරන්න.

viii. 2023.03.01 දින ප්‍රාග්ධනය ලෙස ඉඩමක් යෙදවීමට අදාල ද්විත්ව සටහන් වටිනාකම සහිතව දක්වන්න.

ix. මෙම ව්‍යාපාරය සතු ජංගම නොවන වත්කමක් වටිනාකම සහිතව දක්වන්න.

x. මෙම ව්‍යාපාරයේ හිමිකම අඩුවීමට අදාල ගනුදෙනු දෙකක් වටිනාකම සහිතව සඳහන් කරන්න.

## II – කොටස ව්‍යාපාර අධ්‍යයනය

(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.)

02. i. මිනිස් අවශ්‍යතා යනු මොනවාද? අවශ්‍යතා වල ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

ii. පහත සඳහන් ප්‍රකාශ සත්‍යද අසත්‍යද යන්න දක්වන්න.

අ. ව්‍යාපාර වල ආරම්භය සිදු වන්නේ භාණ්ඩ හුවමාරුව සමගය.

ආ. රජය ව්‍යාපාර වල වර්ධනයට අවශ්‍ය යටිතල පහසුකම් සපයන්නේ නැත.

ඉ. ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරය විශ්ලේෂණයෙන් ශක්තීන් හා දුර්වලතා හඳුනාගත හැකිය.

ඊ. මිනිස් වුවමනා ව්‍යාපාර විසින් තෘප්තිමත් නොකරයි.

iii. ව්‍යාපාර දෙකක් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

a. සීමාසහිත ලක්ජය (පොදු) සමාගම, සුපිරි වෙළඳසැල් ජාලයක් පවත්වාගෙන යයි.

b. සතරසිංහ සහ පුත්‍රයෝ වෙළඳ සැල පාසල් ලිපද්‍රව්‍ය අලෙවි සැලක් පවත්වාගෙන යයි.

අ. ඉහත ව්‍යාපාර කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයකට අයත්ද?

a. b.

ආ. ඉහත ව්‍යාපාර සඳහා බලපාන පනත් දෙකක් සඳහන් කරන්න.

a. b.

iv. සී/ස දිනපාල සමාතම රු. 2 500 000 ක් වටිනා යන්ත්‍ර හා සේවකයින් 5දෙනෙකු යොදාගනිමින් පොල් ලෙලි කැබලි කිරීමේ කර්මාන්තශාලාවක් පවත්වාගෙන යයි. විදේශ රට වලින් මෙම නිෂ්පාදන සඳහා ඉහල ඉල්ලුමක් පවතී.

| | නිෂ්පාදන සාධකය | උදාහරණ |
|---|---|---|
| 1. | | |
| 2. | | |

03. i. ව්‍යාපාර පරිසරය මූලික වශයෙන් වර්ග කර දක්වන්න.

ii. පහත ප්‍රකාශන සත්‍යද අසත්‍යද දක්වන්න.

අ. ස්වභාවික සම්පත් අයත් වන නිෂ්පාදන සාධකය ප්‍රාග්ධනයයි.

ආ. උද්ධමනය යනු භාණ්ඩ හා සේවා වල මිල මට්ටම අඛණ්ඩව ඉහළයාමයි.

ඉ. නවීන යන්ත්‍ර උපකරණහා ගුණාත්මක අමුද්‍රව්‍ය ලබාගැනීමට හැකිවීම ගෝලීය පරිසරයේ අවාසිදායක ප්‍රතිඵලයකි.

ඊ. ව්‍යාපාරයක ඇල්මැති පාර්ශව සැමවිටම බාහිර හා අභ්‍යන්තර පාර්ශවකයට අයත් වේ.

iii. ඉහත වෘත්තීය සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් සඳහා විදේශ රටවල ඉහල ඉල්ලුමක් පවතී.

අ. ඉහත ප්‍රකාශය තුල ඇතුලත් ව්‍යාපාර පරිසර සාධකය කුමක්ද?

ආ. එය ව්‍යාපාර වලට හිතකර බලපෑමක්ද? අහිතකර බලපෑමක්ද?

iv. ව්‍යපාරිකයකුට ව්‍යාපාර පරිසරය පිළිබඳ විශ්ලේෂණය වඩාත් වැදගත් වේ. ව්‍යාපාර පරිසරය විශ්ලේෂණයෙන් ලබාගත හැකි වන්නේ,

04. i. ව්‍යාපාර සංවිධාන අරමුණු අනුව වර්ග කර දක්වන්න.

ii. පහත සඳහන් ප්‍රකාශන සත්‍යද අසත්‍යද යන්න දක්වන්න.

අ. ලෝකයේ බහුලවම දක්නට ලැබෙන ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ, ඒක පුද්ගල ව්‍යාපාර සංවිධානයි.

ආ. සමුපකාර සමිති රජයට අයත් ව්‍යාපාර සංවිධානයකි.

ඉ. සංස්ථාපිත සමාගම් වලට නෛතික පුද්ගලභාවයක් නොමැත.

ඊ. සමුපකාර සමිතියක අවම සාමාජිකයින් සංඛ්‍යා 10 කි.

iii. අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් රජයේ පාසල් සඳහා සී/ස සූර්ය (පොදු) සමාගමෙන් සූර්ය පැනල සවිකිරීමේ ව්‍යාපෘතියක් 2024 දී ආරම්භ කරයි.

අ. ඉහත ප්‍රකාශනය තුල ඇතුලත් ව්‍යාපාර සංවිධාන වර්ගය වනුයේ,

1. 2.

ආ. ඉහත ව්‍යාපාර සංවිධාන හිමිකාරිත්වය අනුව වර්ග කරන්න.

1. 2.

iv. ඉතිරිකරගත් මුදල් 2 000 000 ඇති අශෝක ව්‍යාපාරයක් ඇරඹීම පිළිබඳ අදහසක් පවතී.

අ. ස්වාධීනව කටයුතු කිරීමට අශෝක අදහස් කරයි නම් ආරම්භ කළ යුතු ව්‍යාපාර සංවිධාන වර්ගය වනුයේ,

ආ. වගකීම සීමාසහිත/අඛණ්ඩ පැවැත්මක් ඇති ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කරයි නම් ආරම්භ කළ යුතු ව්‍යාපාර සංවිධාන වර්ගය වනුයේ,

## II – කොටස

ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.

05. i. අ. ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ කුමක්ද?

ආ. වගකීමක ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

ඉ. හිමිකම වැඩිවීමට බලපාන ගනුදෙනු දෙකක් ලියන්න.

ඊ. ලෙජරය යනු කුමක්ද?

*ii.* 2023 ජනවාරි මාසයේ පළමු සතිය තුල සිදුවූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

23.01.01 ප්‍රාග්ධනය යෙදවීම රු. 350 000

23.01.05 වෙළඳ භාණ්ඩ තොගයක් අංජනගෙන් ණයට ගැනුම් 70 000 යි.

23.01.06 රු. 30 000 පිරිවැය වූ භාණ්ඩ රු. 45 000 මුදලට විකිණීම.

23.01.07 සේවක වැටුප් ගෙවීම රු. 3 000 පිරිවැය වූ භාණ්ඩ රු. 45 000 මුදලට විකිණීම.

23.01.07 සේවක වැටුප් ගෙවීම රු. 3 000

අවශ්‍ය වන්නේ,

අ. ඉහත ගනුදෙනු වත්කම් = හිමිකම් + වගකීම් ගිණුම්කරණ සමීකරණයට සිදුකරන බලපෑම වටිනාකම් සහිතව දක්වන්න.

ආ. 23.01.07 දිනට හිමිකම කොපමණද?

ඉ. 23.01.07 දිනට ජංගම වත්කම් වල අගය කීයද?

*iii.* අංජලීගේ ව්‍යාපාරයේ 2023 ජනවාරි මාසයේ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

23.01.01 ප්‍රාග්ධනය යෙදවීම රු. 50 000

23.01.02 බැංකු ණය ගැනීම රු. 30 000

23.01.03 උපකරණ මිලට ගැනීම රු. 25 000

23.01.04 වෙළඳ භාණ්ඩ මුදලට ගැනුම් රු. 15 000

අවශ්‍ය වන්නේ,

අංජලීගේ ව්‍යාපාරයේ ගනුදෙනු ලෙජර් ගිණුම් වල සටහන් කරන්න.

06. i. අ. අවිනිශ්චිත ගිණුම යනු කුමක්ද?

ආ. පොදු ජර්නලයක සටහන් කරන ගනුදෙනු වර්ග 2 ක් ලියන්න.

ii. සීමාසහිත අර්ජුන් සමාගමෙන් රු. 120 000 ක් වටිනා යන්ත්‍රයක් ණයට ගැනීම.

අ. මෙම ගනුදෙනුව සටහන් කරන් මූලික සටහන් පොත

ආ. මෙම ගනුදෙනුව සටහන් කිරීමට අදාල ජර්නල් සටහන

*iii.* 2023.01.31 දිනෙන් අවසන් මාසය තුල සිදුවූ ගනුදෙනු පරීක්ෂා කිරීමේ දී පහත වැරදි අනාවරණය විය.

1. රු. 30 000 ගැනුම් ඉන්වොයිසියක් සටහන් නොකිරීම.
2. රු. 5 000 විදුලි වියදම් ගෙවීම සටහන් කර ඇත්තේ මුදල් පොතේ පමණි.
3. රු. 7 000 ක ආයෝජන ආදායම් ගිණුමේ ශේෂය, ශේස පිරික්සුමට ගෙන ගොස් නොමැත.

අවශ්‍ය වන්නේ,

අ. ඉහත වැරදි නිවැරදි කිරීමට අදාල ජර්නල් සටහන්

ආ. අවිනිශ්චිත ගිණුම

*iv.* අනුෂගේ ව්‍යාපාරයේ 2023.01.31 දින ලද බැංකු ප්‍රකාශනයේ ශේෂය එදිනට බැංකු ගිණුමේ ශේෂය සමග සමාන නොවීය. ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය 28 5000 ක් විය. වෙනසට හේතු පහත දැක්වේ.

1. රු. 28 000 ක් වටිනා චෙක්පත් බැංකු ගිණුමේ තැන්පත් කලව නිශ්කාශනය වී නොමැත.
2. බැංකු ගිණුමේ සටහන් නොවූ බැංකුව අයකල ගාස්තු

   බැංකු ගාස්තු 1 000

   චෙක්පොත් ගාස්තු 500
3. නිකුත්කල නමුත් තවමත් බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත් 37 000
4. ව්‍යාපාරය වෙනුවෙන් බැංකුව සිදුකල ගනුදෙනු
   - i. ණයගැති සෘජුප්‍රේෂණ 6 000
   - ii. ස්ථාවර නියෝග මත ගෙවූ රක්ෂණ 2 000

අවශ්‍ය වන්නේ,

අ. 2023.01.31 දිනට සංශෝධිත බැංකු ගිණුම

ආ. 2023.01.31 දිනට බැංකු සැසදුම් ප්‍රකාශනය

07. i. පහත ගනුදෙනු වාර්තා කිරිමට අදාල මූලාශ්‍ර ලේඛන හා මූලික සටහන් පොත් නම් කරන්න.

අ. රු. 15 000 වැටුප් සඳහා චෙක් පතක් නිකුත් කිරීම.

ආ. රු. 200 000 මෝටර් රථයක් දසුන් සමාගමෙන් ගැනීම.

ii. සුපුන්ගේ ව්‍යාපාරයේ සිදුවූ සුළු මුදල් ගනුදෙනු පහත දක්වේ.

| | | |
|---|---|---|
| 1/1 | අග්‍රිමය ලැබුනා | 5 000 |
| 1/2 | ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම | 500 |
| 1/3 | සිනි තේකොළ මිලදී ගැනීම | 400 |
| 1/4 | ත්‍රිරෝද රථ ගාස්තු | 350 |
| 1/5 | ණයහිමි උපාලිට ගෙව්වා | 1 000 |
| 1/6 | පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය මිලදී ගැනීම | 550 |
| 1/7 | අග්‍රිමය ප්‍රතිපූර්ණය කලා | |

අවශ්‍ය වන්නේ,

සංග්‍රහ, ලිපිද්‍රව්‍ය, ගමන්, විවිධ, විශ්ලේෂනතීරු සහිතව සුළු මුදල් පොතක සටහන් කරන්න.

iii. පහත ගනුදෙනු ගැනුම් ජර්නලයක හා විකුණුම් ජර්නලයක සටහන් කරන්න.

| දිනය | සැපයුම්කරු/ගැනුම්කරු | ඉන්වොයිස් අංකය | වටිනාකම | වෙළඳ වට්ටම් |
|---|---|---|---|---|
| 10/01 | අංජන | 15 | 30 000 | 10% |
| 10/07 | අජන්ත | 35 | 70 000 | 20% |
| 10/20 | සුරංග | 100 | 50 000 | 10% |
| 10/25 | රංග | 101 | 35 000 | 10% |

අවශ්‍ය වන්නේ,

අ. ගැණුම් ජර්නලය

ආ. විකුණුම් ජර්නලය